*සැ. යු.* — 2012.08.24 දින පළ වූ අංක 1,773 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2009 වර්ෂයේ ජනවාරි - මාර්තු කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,774 - 2012 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2012.08.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1386 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 සැප්තැම්බර් මස 21 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 සැප්තැම්බර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1385 - B 80643 — 7,200 (2012/08)
F1-

# පළාත් සභා නිවේදන

## උඩපළාත ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තියේ 'උඃ' ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව උඩපළාත ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධි විධාන පනතේ 2 වැනි වගන්තිය (I) (අ) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම *ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බල පවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2012 ජූලි මස 06 වැනි දින,
මහනුවර, මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

01. මෙම අතුරු ව්‍යවස්ථා උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ වාහන නවතා තැබීම පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනය යෙදවීමේ අරමුණ ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මඟින් එම ස්ථාන සංශෝධනය කිරීම සහ නව ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකිය.

03. උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දෙවන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථානවල, දෙවන උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාල රජයේ ගාස්තුත්, සභාවට මාසිකව ගෙවීමෙන් එකී ස්ථානවල කුලී රථ වාහන නවතා තැබීම කළ යුතු අතර, එම කුලී රථවාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු වලංගු වන්නේ ය.

04. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථවාහන නැවතුම්පොළ වල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර, මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

05. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් මාසයක් වෙනුවෙන් ද ඒ මාසයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

06. බලපත්‍රය ලබා ගැනීම සඳහා තුන්වන උපලේඛනයේ ප්‍රකාර උඩපළාත ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මඟින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියදුරු විසින් අයදුම්කළ යුතු ය.

07. රථ වාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රය ඉදිරිපත් කරන ලෙස රථවාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

08. සෑම මසකම පළමුවන දිනට පෙර අදාල මාසය සඳහා රථවාහන නවතා තැබීමේ බල පත්‍රය ලබාගෙන තිබිය යුතු ය.

09. උඩපළාත ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මොටර් රථයක් කුලී රථවාහන නවතා තැබීමේ නැවතුම්පොළකට ඇතුළ් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථවාහන නැවතුම්පොළකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතු ය. එසේ දැන්වීමක් නොකළ හොත් අදාල මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුලී රථවාහන, නැවතුම්පොළ තුළදී කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයෙකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙකු කුලී රථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හැසිරීම හෝ හිරිහැරයක් වන සේ හැසිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මඟින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය (2) උප වගන්තියෙන් නියමකර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට සහ/හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව යන්නෙන්" උඩපළාත ප්‍රාදේශීය සභාව ද,

"සභාපති යන්නෙන්" උඩපළාත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා යන්නෙන්" උඩපළාත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,

"රථවාහන පාලක යන්නෙන්" උඩපළාත ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත්කර සිටින නිලධාරියෙකු අදහස් වේ.

"මෝටර් රථය හෝ කුලී රථය යන්නෙන්" ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන් රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කෙරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

### පළමුවන උපලේඛනය

*උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන නවතා තැබීමට අනුමත ස්ථාන*

01. පුස්සැල්ලාව නගරශාලාව ඉදිරිපිට දිගින් මීටර් 20ක්,
02. පුස්සැල්ලාව සිංගර් ආයතනය ඉදිරිපිට දිගින් මීටර් 20ක්,
03. පුස්සැල්ලාව පැරණි බස්නැවතුම්පොළ ඉදිරිපිට දිගින් මීටර් 20ක්,
04. පුස්සැල්ලාව රා කඩයට පිවිසුම් මාර්ගය අසල දිගින් මීටර් 20ක්,
05. වහුගපිටිය රෝහල අසල දිගින් මීටර් 15ක්,
06. වහුගපිටිය නගරයේ වප්ලි ජනපදයට හැරෙන ස්ථානය දිගින් මීටර් 15ක්,
07. පාරදෙක නගර හන්දිය දිගින් මීටර් 15ක්,
08. අටබාගේ හන්දිය දිගින් මීටර් 20ක්,
09. දැල්පිටිය හන්දිය දිගින් මීටර් 20ක්,
10. නවදේවිට හන්දිය දිගින් මීටර් 20ක්,
11. මොරගොල්ල හන්දිය දිගින් මීටර් 20ක්,
12. උඩගම හන්දිය දිගින් මීටර් 20ක්,
13. දුනුකේඋල්ල හන්දිය දිගින් මීටර් 20ක්,
14. පාරපහ හන්දිය දිගින් මීටර් 20ක්,
15. දොරගල හන්දිය දිගින් මීටර් 20ක්,
16. පුපුරැස්ස නගර හන්දිය දිගින් මීටර් 20ක්,
17. පන්විලතැන්න හන්දිය දිගින් මීටර් 25ක්,
18. මිල්ලගහමුල හන්දිය හන්දිය දිගින් මීටර් 20ක්,
19. වාරියගල හන්දිය දිගින් මීටර් 15ක්,
20. නිල්ලඹ හන්දිය දිගින් මීටර් 20ක්,
21. මෙගොඩ කලුගමුව - පිහිඹියහේන හන්දිය දිගින් මීටර් 20ක්,
22. දොළුව හන්දිය - සතිපොල ඉදිරිපිට දිගින් මීටර් 20ක්,
23. ගොඩවෙල හන්දිය - දොළුව පාර දිගින් මීටර් 20ක්,
24. පිඟන් සංස්ථා හන්දිය - ගලහ පාර දිගින් මීටර් 20ක්,
25. හල්ඔය නවය කනුව හන්දිය - ගලහ පාර දිගින් මීටර් 20ක්,
26. අප්පුකඩේ හන්දිය - ගලහ පාර දිගින් මීටර් 20ක්,
27. නිල්ලඹ කාර්යාල හන්දිය - ගලහ පාර දිගින් මීටර් 20ක්,
28. මාවතුර හන්දිය - ගලහ පාර දිගින් මීටර් 20ක්,
29. ඉඟුරුවත්ත හන්දිය දිගින් මීටර් 20ක්,
30. ආඩියාකඩවත පල්ලිය අසල දිගින් මීටර් 20ක්,
31. පල්ලේවෙල පාලම අසල දිගින් මීටර් 20ක්,
32. බෝවල පින්තාලිය හන්දිය දිගින් මීටර් 20ක්,
33. කහවත්ත දිගින් මීටර් 20ක්,
34. එගොඩකළුගමුව දිගින් මීටර් 20ක්,
35. ඉලංගවත්ත දිගින් මීටර් 20ක්,
36. නාරංවිට ක්‍රීඩාපිටිය අසල දිගින් මීටර් 20ක්,
37. බෝවල වැව්පිටිය දිගින් මීටර් 20ක්,
38. නිල්ලඹ නව නගරය දිගින් මීටර් 20ක්,
39. මුල්ගම දිගින් මීටර් 20ක්,
40. පල්ලෙලැගුම්දෙණිය දිගින් මීටර් 20ක්,
41. වැවතැන්න විදුහල අසල දිගින් මීටර් 20ක්,
42. ලෙවලන්ඩ්වත්ත දිගින් මීටර් 20ක්,
43. වාරියගල ඉල්ලගොල්ල හන්දිය දිගින් මීටර් 20ක්,
44. ගනේගොඩ දිගින් මීටර් 20ක්,
45. නිල්ලඹ ජලාශය අසල දිගින් මීටර් 20ක්,
46. ස්ටෝෆිල්ඩ් හන්දිය දිගින් මීටර් 20ක්.

### දෙවන උපලේඛනය

*කුලී රථ නවතා තැබීම සඳහා මසකට ගාස්තු*

| | | |
|---|---|---|
| 01. | ලොරියක් සඳහා | රු. 500 මසකට |
| 02. | වෑන් රථයක් සඳහා | රු. 500 මසකට |
| 03. | ටේලරය සහිත ට්‍රැක්ටරයක් සඳහා | රු. 250 මසකට |
| 04. | ත්‍රීරෝද රථයක් සඳහා | රු. 100 මසකට |
| 05. | මෝටර් රථයක් සඳහා | රු. 500 මසකට |
| 06. | අත් ට්‍රැක්ටරයක් සඳහා | රු. 250 මසකට |

### තුන්වන උපලේඛනය

*උඩපළාත ප්‍රාදේශීය සභාව*

*වාහන ලියාපදිංචිය සඳහා හා බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත*

1. වාහනයේ අංකය සහ වර්ගය :————.
2. අයිතිකරුගේ නම :————.
3. හැඳුනුම්පත් අංකය :————.
4. අයිතිකරුගේ ලිපිනය :————.

5. රියදුරුගේ නම :————.
6. රියදුරුගේ හැඳුනුම්පත් අංකය :————.
7. රියදුරු බලපත්‍ර අංකය :————.
8. රියදුරුගේ ලිපිනය :————.
9. වාහනය නවතා තැබීමට ඉල්ලන ස්ථානය :————.
10. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාර්යයක් සඳහා ද, :————.
11. එහි ධාරිතාව/ප්‍රමාණය :————.

ඉහත තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ/රියදුරුගේ අත්සන.

දිනය :————.

*සභාපතිගේ අනුමැතිය :*

රු. .................... ක ගාස්තුවක් අයකර බලපත්‍රය ලබාදීම අනුමත කරමි./නොකරමි.

————,
සභාපති,
උඩපලාත ප්‍රාදේශීය සභාව,
දැල්පිටිය-අටබාගේ.

දිනය :————.

08-786/1

---

**උඩපලාත ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තියේ 'උ' ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව උඩපලාත ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය (I) (අ) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව උඩපලාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බල පවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2012 ජූලි මස 06 වැනි දින,
මහනුවර, මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**ආදාහනාගාර කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

01. මෙම අතුරු ව්‍යවස්ථා උඩපලාත ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර කටයුතු පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්වේ.

02. උඩපලාත ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාර භාවිතා කිරීම, පාලනය කිරීම හා එකී ආදාහනාගාරය භාවිතා කිරීම සඳහා වන ගාස්තු නියම කිරීම හා අයකිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

03. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයක කිසිම මෘත ශරීරයක් හෝ මෘත ශරීරයක කොටසක් හෝ මිනිස් කළලයක් ආදාහනය නොකළ යුතු ය.

04. මෙම අතුරු ව්‍යවස්ථා වල තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මතු ඉල්ලුම්කරු යැයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් "1" උපලේඛනයට අනුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමඟ සභාපතිවරයා වෙත හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) මියගිය අය හා අයදුම්කරු අතර ඥාතීත්වය තහවුරු කළහැකි ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු ය. (මේ සඳහා මියගිය අය පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් හෝ සභාවේ ගරු සභිකයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් හෝ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ විවාහ සහතිකය හෝ වෙනත් එවැනි සහතිකයක් ප්‍රමාණවත් වේ.)

(ii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක පිටපතක් හෝ අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරුකළහැකි වෙනත් ලියවිල්ලක්,

(iii) 1975 අංක 41 දරන විවාහ උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 110 වැනි පරිච්ඡේදයේ II වැනි වගන්තියේ විධිවිධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයේ උඩපලාත ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ආදාහනය කරන බවට සඳහන් වී තිබිය යුතු ය.

(iv) මිය ගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය.

(v) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

05. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සභාපති හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු වන්නේ ය. ඒ අනුපිළිවෙල මත ආදාහන වේලාව නියම කර අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

06. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාර ගාස්තු ලෙස රු. 6,000 ක ගාස්තුවක් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු ය. මෙම ගාස්තු ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියක් මගින් වරින් වර සංශෝධනය කළ හැකිය. එකී ගාස්තු ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතු ය. එම ගාස්තු සභා කාර්යාලයේ සහ ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

07. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම් ඒ බව එයට හේතු වූ කරුණු ද සමඟ ඉල්ලුම්කරුට අයදුම්පත ලද වහාම දැන්විය යුතු ය.

08. සෑම දිනකම පෙරවරු 6.00ත් පස්වරු 6.00ත් අතර කාලය තුළ පමණක් ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරදිය යුතු ය. පස්වරු 6.00 ට පෙරාතුව වූ වේලාවක ආදාහනය සඳහා භාරගත් මෘත ශරීරයක් පස්වරු 6.00 පසු වූව ද ආදාහනය කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

09. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන් කර ඇති වේලාව හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

10. සෑම ආදාහනාගාරයකම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය මිය ගිය අයගේ නම හා ඔහු මිය යාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමඟ තිබූ සම්බන්ධතාවය ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ඇතුලත් ලේඛනයක් ආදාහනාගාරය භාරකරු විසින් පවත්වාගෙන යා යුතු ය.

11. ආදාහනාගාරයේ දේහය ආදාහනය කරන අවස්ථාවේ යාන්ත්‍රික දෝෂයක් මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් සභාපතිවරයාගේ උපදෙස් මත එකී දේහය පිළිබඳව වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉල්ලුම්කරු විසින් එකඟ විය යුතු ය.

12. මෘත ශරීරය ආදාහනය කර පැය 72ක් ගත වීමට ප්‍රථම ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා භස්මාවශේෂ භාරගත යුතුවේ. නියමිත කාලය ඇතුලත භාරගනු නොලබන භස්මාවශේෂ කවරාකාරයකට හෝ බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

13. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැතිව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේ වුව ද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍රලාභියෙකු සමඟ පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

14. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළ වලට අලාභ හානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින්ට හෝ රාජකාරි කටයුතු වලට බාධා කිරීම හෝ නොකළ යුතු ය. ඉදින් එවැනි අලාභයක් හෝ හානියක් හෝ සිදුවුවහොත් එකී ආදාහනයට අදාළ වූ අවසරපත්‍රධාරියා වග කිව යුතු වේ. එවැනි අලාභයක් තක්සේරු කිරීමෙන් අනතුරුව එම අලාභය බලපත්‍රධාරියා වෙත දැක්වීමෙන් පසුව ඔහු විසින් එම වටිනාකම ගෙවිය යුතු ය. එම ගෙවීම පැහැර හරින්නේ නම් නිසි බලයලත් අධිකරණයක් හමුවට පමුණුවා එකී මුදල දඩයක් පරිදි අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

15. ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම ප්‍රාදේශීය සභාවේ ලිඛිත අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

16. ආදාහනාගාරයක නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූවිට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තව දුරටත් කරගෙන යන විටෙක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියේ නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් උඩපළාත ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් තත්කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව උඩපළාත ප්‍රාදේශීය සභාවට පත්කර ගන්නා ලද සභාපතිවරයා ද,

"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහි කරන ලද සිරුරක් ද,

"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද අදහස් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

## උපලේඛනය I

*උඩපළාත ප්‍රාදේශීය සභාවේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්රකරුගේ සම්පූර්ණ නම :—————.
 ලිපිනය :—————.
 ජාතික හැඳුනුම්පත් අංකය :—————.
 ග්‍රාම නිලධාරි වසම :—————.

02. මිය ගිය අයගේ නම :—————.
 මිය ගිය අයගේ ලිපිනය :—————.
 ජාතික හැඳුනුම්පත් අංකය :—————.
 ග්‍රාම නිලධාරි වසම :—————.
 ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :—————.

03. අයදුම්කරු මිය ගිය අයට ඇති ඥාති සම්බන්ධය :—————.
04. මරණ සහතිකයේ අංකය හා දිනය :—————.
05. මරණ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :—————.
06. මරණයට හේතුව :—————.
07. මරණ පරීක්ෂණයක් තිබුණේ නම් එය පවත්වන ලද දිනය හා වේලාව :—————.
08. මරණ පරීක්ෂකගේ නම හා තනතුර :—————.
09. මරණ පරීක්ෂකගේ තීරණය :—————.
10. මෘත ශරීරය ආදාහනය සඳහා අවසර ලැබුණේ ද/නොලැබුණේ ද යන වග :—————.
11. ආදාහනය කිරීමට අදහස් කරන දිනය හා වේලාව :—————.
12. දුරකථන අංකය :—————.

ඉහත මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය සියළු සහතික මේ සමඟ අමුණා ඇත.

..............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා :*

(1) අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි./නොකරමි.

........................ ලේකම්.

................................. සභාපති/බලය පැවරූ නිලධාරියා.

.......................... ප්‍රාදේශීය සභාව

....................... ප්‍රාදේශීය සභාව

දිනය :—————.

දිනය :—————.

(2) අංක ............................ හා .............................. දිනැති ලදුපත රු. ..................ක් අය කරන ලදී.

(3) ඉල්ලීම ඉටු කිරීමට අවසර දීම නිර්දේශ කරමි./නොකරමි.

(4) නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :—————.

.......................................
විෂය ලිපිකරු.

දිනය :—————.

08-786/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.